**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්**
**සිසුන් සඳහා උපකාරක සම්මන්ත්‍රණ මාලාව**
**ව්‍යවසායකත්ව අධ්‍යයනය**
**පෙරහුරු ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු**
**II පත්‍රය**

01)

(i) නැවුම් ජලය පානය කරමු.

(ii) ඔව්. සැලසුම් කළ යුතුය. ඕනෑම ව්‍යාපාර කටයුත්තක් සාර්ථකව කරගෙන යාම සඳහා සැලසුමක් තිබීම අවශ්‍ය වේ.

(iii) 1. විධායක සාරාංශය
2. නිෂ්පාදන සැලැස්ම
3. අලෙවි සැලැස්ම
4. මූල්‍ය සැලසුම
5. පරිපාලන සැලැස්ම

(iv) 1. විද්‍යාත්මක හා කාර්මික තාක්ෂණ ආයතනය
2. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

(v) විද්‍යාත්මක හා කාර්මික තාක්ෂණ ආයතනය

(vi) මුළු ජංගම නොවන වත්කම්වල වටිනාකම

| | |
|---|---|
| ඉඩම් පිරිවැය | 1 000 000 |
| ගොඩනැගිලි පිරිවැය | 500 000 |
| උපකරණ පිරිවැය | 300 000 |
| | 1 800 000 |

(vii) මූලික ප්‍රාග්ධනය ගණනය කිරීම

| | |
|---|---|
| ජංගම නොවන වත්කම් මිලට ගැනීම | 1 800 000 |
| ලියාපදිංචි ගාස්තු | 25 000 |
| ව්‍යාපාර සැලැස්ම සඳහා | 50 000 |
| අනෙකුත් වියදම් | 75 000 |
| | 1 950 000 |

(viii) කාරක ප්‍රාග්ධනය

(ix) <u>මූල්‍ය ගලායාම් 4 ක්</u>

| | |
|---|---|
| ඉඩම් සඳහා | 1 000 000 |
| ගොඩනැගිලි සඳහා | 500 000 |
| ලියාපදිංචි ගාස්තු | 25 000 |
| අනෙකුත් වියදම් | 75 000 |

(x) <u>මුදල් ගලාඒම් 2 ක්</u>

| | |
|---|---|
| වතුර බෝතල් අලෙවියෙන් | 500 000 |
| හිස් භාජන ඇප තැන්පතු | 50 000 |

(ලකුණු 2×10 = 20)

02)

(i) ව්‍යාපාර සාර්ථකවීමට හෝ අසාර්ථකවීමට ඇති ඉඩ ප්‍රස්තාවයි.

(ii) 1. ආර්ථික කටයුත්තක යෙදීම.
2. අවදානමකට මුහුණ දීම.
3. ගනුදෙනුවල නිරත වීම.
4. සම්පත් භාවිත කිරීම.
5. නිෂ්පාදනය, මිලදී ගැනීම හා විකිණීම සම්බන්ධව තීරණ ගැනීම.
6. තරඟයට මුහුණ දීම.
7. පැවැත්ම ගැන සිතීම.
8. ස්වයං පෙළඹවීමක් තිබීම. (මෙයින් ඕනෑම පිළිතුරු 02 ක්)

(iii) 1.ස්වකීය දෛවය තමා මතම රඳා පැවතීම.
2.කාර්යයන්හි විවිධත්වයක් ඇතිවීම.
3. සමාජීය සුභ සාධනය සඳහා දායක විය හැකි වීම.
4. ප්‍රයෝජනයට නොගත් හැකියා යොදා ගත හැකිවීම.
5.ආකර්ශණීය ලාභයක් ඉපයීම.
6. ස්වයංපෝෂිත බව.
7.වර්ධනය සඳහා පුද්ගලයන්ට ලැබෙන්නා වූ උපරිම අවකාශය.
8. නිදහස හා ඉතා ඉහළ තෘප්තියකට පත්වීම.
(මෙයින් ඕනෑම පිළිතුරු 02 ක්)

(iv) 1. නව සොයා ගැනීමක්
2. දිගුවක්
3. අනුකරණය කිරීමක්
4. සංකලනයක්
(මෙයින් ඕනෑම පිළිතුරු 02 ක්)

(v) 1.සෘණාත්මක විශ්වාස හා ආකල්ප කෙරෙහි ගැලී සිටීම.
2. යම් ගැටළුවකට එකම විසඳුමක් පමණක් ඇතැයි සිතීම.
3. ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම.
4. තර්කානුකූල පදනමක පිහිටා කටයුතු නොකිරීම.
5. ප්‍රායෝගිකවීමට බාධා ඇතැයි සිතීම.
6. රීති හා සම්ප්‍රදාය අනවබෝධයෙන් පිළි පැදීම. (මෙයින් ඕනෑම පිළිතුරු 02 ක්)
7. වැරදීම් හා විවේචන සඳහා ඇති බිය. (ලකුණු 2×5=10)

03)

(i) 1. කුඩා ප්‍රාග්ධනයක් යොදා තිබීම.
2. සේවක සංඛ්‍යාව සාපේක්ෂව අඩුවීම.
3. ව්‍යාපාරය තනි අයිතිකරුවෙකු සතු වීම.
4. ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී තීරණ ගැනීමට ඇති අපහසුව.
5. ව්‍යාපාර කටයුතු කුඩා ප්‍රදේශයකට පමණක් සීමා වීම. (මෙයින් ඕනෑම පිළිතුරු 02 ක්)

(ii) 1. ව්‍යාපාරයට අවශ්‍ය ප්‍රාග්ධනය රැස්කර ගන්නා මාර්ග සීමා වීම.
2. නවීන තාක්ෂණය භාවිතා නොවීම.
3. වෙළෙඳපල සීමා පැවතීම.
4. ව්‍යාපාරික කටයුතුවලට තම පවුලේ සාමාජිකයන්ගේ මැදිහත්වීම වැඩිවීම.
5. ව්‍යාපාර හිමිකරුගේ ව්‍යාපාරික පලපුරුද්ද සහ දැනුම සීමාකාරි වීම.

(iii) 1. ව්‍යාපාරයේ මුදල් කටයුතු පාලනය දුර්වල වීම.
2. තරඟකාරීත්වයට මුහුණදීමට අපහසු වීම.
3. ව්‍යාපාරික කටයුතු සැලසුම්වලින් තොරව සිදුවීම.
4. බොහෝ ව්‍යාපාරිකයන් ව්‍යවසායකයෙකු ලෙස නොසිතීම.
5. ව්‍යාපාරයේ සම්පත් නිවැරදිව පාලනය නොකිරීම.
6. ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් පවතින පලපුරුද්ද ප්‍රමාණවත් නොවීම.

7. දුර්වල මානව සම්බන්ධතා.(මෙයින් ඕනෑම පිළිතුරු 02 ක්)

(iv) 1. අවශ්‍ය සම්පත් සැපයීම.
2. අවදානම් දැරීම.
3. වැදගත් තීරණ ගැනීම.(කාලයට හා කාර්යයට)(මෙයින් ඕනෑම පිළිතුරු 02 ක්)

(v) 1. ව්‍යාපාරයට ගෙනා යන්ත්‍රයක් නිවැරදිව ස්ථානගත කිරීම, ක්‍රියාත්මක කිරීම, අලුත්වැඩියා කිරීම.
2. විධිමත් පටිපාටියක් අනුගමනය කොට වඩා හොඳ සේවකයෙකු බඳවා ගැනීම.
සහ පිළිගත හැකි වෙනත් කරුණු (මෙයින් ඕනෑම පිළිතුරු 02 ක්)
(ලකුණු 2×5=10)

04)

(i) 1. ප්‍රජා පරිසරය
2. ආර්ථික පරිසරය
3. දේශපාලන හා නෛතික පරිසරය
4. තාක්ෂණිකපරිසරය
5. ස්වභාවිකපරිසරය

(ii) ව්‍යාපාර සැලසුම් සකස් කිරීම, සැලසුමට අනුව කටයුතු සිදුවනවා දැයි සොයා බැලීම.

(iii) සමාජ හා සංස්කෘතික පරිසරය

(iv) ප්‍රාථමික, ද්විතියික, තෘතියික

(v) වයිෆයි රවුටරය (ලකුණු 2×5=10)

05)

(i) 1. වෙළෙඳපල විශ්ලේෂණය
2. විකුණුම් පුරෝකතනය
3. අලෙවි ආදායම හා අලෙවි වියදම
4. අලෙවි ස්ථාවර වත්කම්
(පිළිවෙලින් අපේක්ෂා නොකෙරේ.)

(ii) 1. පාරිභෝගිකයන්ට ප්‍රශ්නාවලි ලබාදීම
2. පාරිභෝගිකයන් සමඟ සම්මුඛ සාකච්ඡා කිරීම
3. පාරිභෝගිකයන්ගේ හැසිරීම් නිරීක්ෂණය කිරීම
4. මාධ්‍ය (පුවත්පත්, අන්තර්ජාලය වැනි)

(iii) 1. මීකිරි - යෝගට්
2. තේ, කෝපි - නෙස්කැෆේ
3. බීම බෝතල - ෆෲට් ජූස්/ පළතුරු බීම

(iv) 4Ps /නිෂ්පාදිතය, මිල,ස්ථානය හා ප්‍රවර්ධනය (කුමන හෝ පිළිතුරකට ලකුණු දෙන්න.)

(v) අලෙවි හා බෙදා හැරීමේ කාර්යයන්හීදී භාවිතා කරන
1.පරිගණක හා තාක්ෂණික උපකරණ
2.බෙදාහැරීමේ රථවාහන
3.ලිබඩු උපකරණ (ලකුණු 2×5=10)

06)

(i) 1. අරමුණක් පැවතීම
2. සීමිත සම්පත් භාවිතය
3. ආර්ථික කටයුත්තක නියැලීම
4. පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් එකතු වී කටයුතු කරයි.

(ii) 1. කේවල ස්වාමි ව්‍යාපාර
2. හවුල් ව්‍යාපාර
3. සංස්ථාපිත සමාගම්

(iii) 1. හවුල්කරුවන් සිටීම.
2. සාමූහික එකඟත්වයක් පැවතීම.
3. ලාභ ලැබීමේ චේතනාවෙන් කටයුතු කිරීම.
4. ව්‍යාපාර කටයුත්තක නියැලීම.

(iv) 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද නෛතික පුද්ගලභාවයක් හා අඛණ්ඩ පැවැත්මක් ඇති ව්‍යාපාර සංවිධාන

(v) 1. වරලත් හිමියා　　2. වරලත් ලාභියා

(ලකුණු 2×5=10)

07)

(1)

| | | |
|---|---|---|
| 2017.01.01 දිනට මුදල් ශේෂය | | 18 000 |
| <u>මාසය තුළ ලැබීම්</u> | | |
| විකුණුම් ආදායම | | <u>356 000</u> |
| | | 374 000 |
| - <u>මාසය තුළ ගෙවීම්</u> | | |
| ගැනුම් | 120 000 | |
| පරිපාලන වියදම් | 12 500 | |
| විකුණුම් වියදම් | 180 000 | |
| මූල්‍ය වියදම් | 8 000 | |
| වෙනත් වියදම් | <u>2 000</u> | <u>(322 500)</u> |
| 2017.01.31 දිනට මුදල් ශේෂය | | 51 500 |

(ලකුණු 04)

(2)

පූර්ණිමාගේ ව්‍යාපාරයේ
2017 ජනවාරි 31 දිනෙන් අවසන් මාසය සඳහා
ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනය

| | | |
|---|---|---|
| විකුණුම් ආදායම | | 356 000 |
| - <u>විකුණුම් පිරිවැය</u> | | |
| ජන 01 තොගය | 40 000 | |
| + ගැනුම් | 120 000 | |
| | 160 000 | |
| - ජන 31 තොගය | (23 000) | (137 000) |
| වර්ෂයේ දළ ලාභය | | 219 000 |
| පරිපාලන වියදම් | 12 500 | |
| විකුණුම් වියදම් | 180 000 | |
| මූල්‍ය වියදම් | 8 000 | |
| වෙනත් වියදම් | 2 000 | (202 500) |
| මාසයේ ශුද්ධ ලාභය | | 16 500 |

(ලකුණු 06)

(මුළු ලකුණු 10)